සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
**Department of Divineguma Development**

4 වන මහල, සෙත්සිරිපාය, 1වන අදියර,බත්තරමුල්ල.
4 வது மாடி,செத்சிறிபாய, 1ம் கட்டம், பத்தரமுல்ல
4th floor, **Sethsiripaya , 1st Stage, Battaramulla**

මගේ අංකය
எனது இல ....................................
My No

ඔබේ අංකය
உமது இல ....................................
Your No

දිනය
திகதி ....................................
Date

## දිවිනැගුම චක්‍රලේඛ අංක :- 2016/11

සියළුම දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්
සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් වෙත,
.......................................

### පරිසර හිතකාමී ආදර්ශ ගම්මාන වැඩසටහන

### 01. හැදින්වීම:-

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන හා ඒකාබද්ධව “වස විස නැති රටක් ” සහ “ධාර්මික ගොවිතැනක්, නීරෝගී ජනතාවක් ” බිහිකිරීමේ අරමුණින් ඒකාබද්ධ ප්‍රවේශයක් තුලින් සමෝධානික, බහු ආංශික, පරිසර හිතකාමී වූ ආදර්ශ ගම්මාන නිර්මාණය කිරීම මේ යටතේ අපේක්ෂා කෙරේ.

### 02. අරමුණු:-

- චිරස්ථායී නිෂ්පාදන ක්‍රමවේදයක් තුලින් පවුලේ පෝෂණය සහ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම.
- ප්‍රජා සහභාගීත්වය උපරිම ලෙස යොදා ගනිමින්, ග්‍රාමීය නිෂ්පාදන වැඩිදියුණු කර, අලෙවිකරණ ජාලයට සම්බන්ධ කර, ඔවුන්ගේ ආර්ථිකය සවිබල ගැන්වීම.
- සමාජ සංවර්ධනය සහ අනෙකුත් පොදු පහසුකම් ප්‍රශස්ත මට්ටමකට පත් කරමින්, ක්‍රියාකාරී ගම්මාන පද්ධතියක් බිහිකිරීම.
- අන් අයට ද ආදර්ශයක් වන පරිදි, දැනුම හා සතුට ලබාගත හැකි පරිදි, සමෝධානික ආදර්ශ ගම්මානයක් බිහිකිරීම.
- දිළිඳුකම පිටුදැකීමේ ජාතික මෙහෙවරට මනා ආදර්ශයක් ලබාදිය හැකි වන ලෙස දරිද්‍රතාවයෙන් පෙළෙන පවුල් සවිබල ගැන්වීම.


| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්<br>மேலதிக பணிப்பாளர்தலைமையதிபதி<br>Additional Director General | අධ්‍යක්ෂ (පාලන)<br>பணிப்பாளர் (நிர்வாகம்)<br>Director (Administration) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2887280 | 011-2873996 | **011- 2887722(Hotline)** |
| E-mail- | dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | |

## 03. ගම්මාන තෝරා ගැනීම:-

- අනෙකුත් අදාල රේඛීය ආයතන සමග සාකච්ඡා කර ගම්මාන 5 ක් තෝරා ගෙන, ප්‍රමුඛතා ගත කර, පළමු අදියරට ඉතා සුදුසු ගම්මානය තෝරා ගැනීම.
- විවිධ ක්ෂේත්‍රවලට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් සපිරි, උචිත පාරිසරික තත්ත්වයන්ගෙන් හෙබි ගම්මානයක් වීම.
- ආදර්ශ ගම්මානවල සාර්ථකත්වයට, ඊට ඍජුවම දායකත්වය සපයන නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය ප්‍රබල සාධකයක් වන බැවින්, ක්‍රියාකාරී සහ ආකල්පවලින් පොහොසත් නිලධාරීන්ගේ සේවය ලබාගත හැකි ගම්මානයක් වීම.
- මෙවැනි වැඩපිළිවෙලකට උනන්දුව හා ධෛර්යය ඇති ජනතාවක් වෙසෙන ගම්මානයක් වීම.
- ගම්මානයට පිවිසීමට අවශ්‍ය මාර්ග පහසුකම් ප්‍රශස්ත මට්ටමක තිබීම.

## 04. ප්‍රතිලාභීන් තෝරා ගැනීම:-

ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී අඩු ආදායම්ලාභී පවුල් මෙන්ම ආදර්ශ ගම්මානය නිර්මාණය කිරීමට අවශ්‍ය විශේෂ හැකියාවන් ඇති සාමාජිකයින් සිටින පවුල් තෝරාගත හැකිය. සමූහයක් සම්බන්ධ කර ගනිමින් ක්‍රියාත්මක කළ යුතු පොදු ව්‍යාපෘතිවලදී අඩු ආදායම්ලාභී නොවන හා එමෙන්ම අවට වසම්වල වෙසෙන පවුල්වලට ද මෙමගින් ඍජු හෝ වක්‍ර ප්‍රතිලාභ ලැබිය හැකිය.

## 05. සංවර්ධන සැලැස්මට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ ස්ථාපිත අංශ:-

1. ජීවනෝපාය සංවර්ධන අංශය.
   (කෘෂි / ධීවර/පශු/කුඩා කර්මාන්ත/ වෘත්තීය පුහුණු/යටිතල පහසුකම් ආදී ව්‍යාපෘති)
2. අලෙවි සංවර්ධන අංශය
   (අලෙවි මධ්‍යස්ථාන / අලෙවි සැල්/ ජංගම අලෙවි රථ/ ගබඩා/ප්‍රවාහන පහසුකම් ආදී ව්‍යාපෘති)
3. සමාජ සංවර්ධන අංශය
   (දුම්වැටි හා මත්ද්‍රව්‍ය නිවාරණය/ පෝෂණ/උපදේශන/වැසිකිලි/නිවාස වැනි ව්‍යාපෘති)
4. ප්‍රජාමූල සංවිධාන අංශය
   (දිවිනැගුම ප්‍රජා මූල සංවිධානය ශක්තිමත් කිරීම)
5. පුහුණු අංශය
   ( ව්‍යවසායකත්ව පුහුණු / නිලධාරී පුහුණු වැනි)
6. ක්ෂුද්‍ර මූල්‍ය අංශය

**06.** **ගම්මාන සංවර්ධන සැලැස්ම සකස් කිරීම :-**

සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී ග්‍රාමීය මට්ටමේ පහත සඳහන් ක්ෂේත්‍ර නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර ගැනීම වඩාත් යෝග්‍ය වේ.

1. ආර්ථික සංවර්ධන නිලධාරී
2. ග්‍රාම නිලධාරී
3. දිවිනැගුම සංවර්ධන නිලධාරී
4. කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර
5. පවුල් සෞඛ්‍ය සේවිකා

මෙම කමිටුවේ කැඳවුම්කරු ලෙස දිවිනැගුම සංවර්ධන නිලධාරී පත් කර ගන්නා ලෙස දන්වමි. තවද, දැනටමත් එම සැලැස්ම සකස් කර අවසන් නම්, එයට මෙම කමිටුවේ නිර්දේශ ලබාගත යුතු අතර, එය යාවත්කාලීන කිරීමේදී මෙම කමිටුව ක්‍රියාකාරීව යොදවා ගැනීමට කටයුතු කළ යුතු වේ.

මෙම සැලැස්ම, ග්‍රාමීය සංවර්ධනයේදී අවශ්‍යවන සියළු ක්ෂේත්‍රයන් ආවරණය වන ලෙස, ඒ ඒ ක්ෂේත්‍ර සඳහා සකස් කරනු ලබන විස්තර සහිත සැලසුම්වලින් සමන්විත විය යුතු වේ. මෙම සැලැස්ම ග්‍රාමීය සංවර්ධනයට අදාළ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමේ නිලධාරීන් කැඳවා, ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් අනුමැතියට ඉදිරිපත් කිරීමට පෙර හා ඉන් අනතුරුව අවස්ථානුකූලව සමාලෝචනය කළ යුතු වේ. තවද, දිස්ත්‍රික් මට්ටමේදී, දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ / දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් හා අදාළ තාක්ෂණික නිලධාරීන් ඇතුළු අංශ ප්‍රධානීන්ගේ රැස්වීමක දී සමාලෝචනය කර සකස් කර ගත යුතු අතර සැලසුම යාවත්කාලීන වූ විට නැවත සමාලෝචනයට ලක් කළ යුතු වේ.

මෙම වැඩසටහන යටතේ යම් විශේෂ නිෂ්පාදන හෝ සේවා ක්ෂේත්‍රයන් එකක් හෝ කිහිපයක් වඩාත් උසස් මට්ටමකට පත්කොට, අනෙකුත් ප්‍රජාවට ආදර්ශයක් සැපයිය හැකි වන පරිදි, සංවර්ධන සැලැස්ම ඉදිරිපත් වීම අත්‍යාවශ්‍යවේ. මෙහිදී, එම ප්‍රදේශයේ ප්‍රාථමික නිෂ්පාදන සලකා බලා වෙළඳ සම්බන්ධතාවයන් ගොඩනගන කේන්ද්‍රීය ආයතනයක් වශයෙන් වුව ද මෙම ගම්මානය සංවර්ධනය කළ හැකි වන පරිදි සැලැස්ම සකස් කළ හැකිය. මෙම සැලැස්ම 2019 වර්ෂය දක්වා වන පරිදි සකස් කර, ඒ ඒ වසරේ ක්‍රියාත්මක කළ හැකි අදියරයන් වෙන් වෙන්ව හඳුනාගත යුතු වේ. තවද, ඉදිරියේදී මෙම සැලැස්ම නව සංවර්ධන ප්‍රවේශයන් සහිතව යාවත්කාලීන කිරීම කෙරෙහි ද අවධානය යොමු කළ යුතුවේ.

## 07. ප්‍රතිපාදන:-

ඉහත දැක්වෙන ව්‍යාපෘතිවලට අදාළව මෙම වසරේදී එක් ගම්මානයක් පමණක් ආදර්ශයක් වශයෙන් සංවර්ධනය කිරීම සඳහා තෝරා ගත යුතු අතර, ඒ සඳහා රු.මි. 6 ක් පමණ වෙන් කිරීමේ හැකියාව ඇත. විශේෂ අවශ්‍යතාවයක්සේ සලකා යම් දිස්ත්‍රික්කයකින් ආදර්ශ ගම්මාන කිහිපයක් තෝරා ගැනීමට සිදුවුවහොත්, ඒ සඳහා ලබාදෙන ප්‍රතිපාදන පිළිබඳව අවශ්‍ය උපදෙස් ඉදිරියේදී ලබා දීමට කටයුතු කෙරේ. ජීවනෝපාය හා අලෙවි ව්‍යාපෘති සඳහා අවම වශයෙන් 20% ක වත් ප්‍රතිලාභී දායකත්වය ලබා ගත යුතු වේ.

මෙම කාර්යාලයේ ඉහත සඳහන් අංශ සමග මනා සම්බන්ධීකරණයකින් යුතුව ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන හා මුදල් අග්‍රිම ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ.

ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ ණය වැඩසටහන් වලට අමතරව ජීවනෝපාය චක්‍රීය ණය අරමුදල මගින් ද ණය ලබාදීමට උපරිම ලෙස භාවිතයට ගත යුතුය. තවද, සකස් කළ ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා වෙනත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ප්‍රජා සංවිධාන / පෞද්ගලික අංශය /දානපතීන් වැනි පුද්ගලයින් සම්බන්ධීකරණය කිරීම හා අදාල සහභාගීත්වය ලබා ගැනීමට සැලසුම් කළ යුතු වේ.

## 08. ක්‍රියාත්මක ක්‍රමවේදය:-

- සෑම ව්‍යාපෘති යෝජනාවක් සඳහාම දිවිනැගුම ප්‍රජාමූල සංවිධානය ඇතුළු අදාළ ප්‍රජා මූල සංවිධාන නියෝජිතයින්ගේත් අදාළ සහාය සේවා / තාක්ෂණික සේවා සපයන නිලධාරීන්ගේත් නිර්දේශ හා අවශ්‍ය සහයෝගය ලබාගත යුතු වේ.

- මෙම ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදී ඇති අදාළ ආකෘති පත්‍රයට අනුව ව්‍යාපෘති වාර්තා සකස් කළ යුතු අතර, එය දිවිනැගුම සංවර්ධන නිලධාරීන්ගේ කලාප කළමනාකරුගේ ව්‍යාපෘති කළමනාකරුගේ, මූලස්ථාන කළමනාකරුගේ නිර්දේශ ලබාදී ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයෙන් දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කොට අනුමත කර ගත යුතු වේ.

- ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව පිහිටුවා තිබේ නම් සංවර්ධන සැලැස්ම පිළිබඳව එම කමිටු දැනුම්වත් කිරීමට කටයුතු කළ යුතු වේ. සැලැස්මේ පිටපතක් මෙම කාර්යාලය වෙත ද ලබාදිය යුතු වේ.

- චක්‍රලේඛ ප්‍රකාරව ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභී දායකත්වය ලබා දිය යුතු අතර, එය ශ්‍රමය, අමුද්‍රව්‍ය හෝ වෙනත් දායකත්වයක් විය හැකිය.

- අදාල සහාය සේවා / තාක්ෂණික සේවා සපයන ආයතන සහ ප්‍රජා මූල සංවිධාන සමග සම්බන්ධීකරණයකින් යුතුව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ.
- ප්‍රජා සහභාගීත්වය ඉහළ මට්ටමකින් පවත්වා ගැනීම සඳහා ඉහත කී ග්‍රාමීය කමිටුව සක්‍රීයව යොදවා ගත යුතු වේ.
- ව්‍යාපෘතිවල තිරසාර පැවැත්ම තහවුරු කිරීම සඳහා සුදුසු විධිවිධාන යොදා තිබිය යුතුවේ. මේ සඳහා අදාල රාජ්‍ය ආයතන සමග ඒකාබද්ධව හා සහයෝගයෙන් කටයුතු කල යුතුය.
- ව්‍යාපෘති ආරම්භ කිරීම, අඛණ්ඩව පවත්වාගෙන යාම, ප්‍රතිලාභී දායකත්වය ලබා ගැනීම හා ණය වාරික ගෙවීම් නිසි පරිදි සිදු කරන බවට ප්‍රතිලාභීන් සමග ගිවිසුම් ගත විය යුතු අතර, ප්‍රාදේශීය ලේකම් හෝ ඒ වෙනුවට බලය පවරන ලද දිවිනැගුම මූලස්ථාන කළමනාකරු, ප්‍රතිලාභීන් සමග ගිවිසුමකට එළඹීම අත්‍යවශ්‍ය වේ. දැනට ක්ෂේත්‍රයෙහි භාවිතා කරන ගිවිසුම් ආකෘතිය මෙහිදී සුදුසු පරිදි සකස් කරගන්න.
- අනුමත කරනු ලබන සියළු ව්‍යාපෘති සඳහා වු සියළු මිලදී ගැනීම් සඳහා රජයේ ප්‍රසම්පාදන නීති රීති, මුදල් රෙගුලාසි අනුගමනය කිරීමටත්, අදාල ආයතන, දෙපාර්තමේන්තුවල මිල ගණන්ද සැලකිල්ලට ගෙන ගෙවීම් සිදුකිරීමටත් අදාළ රේඛිය ආයතනවල නිර්දේශයන් ලබා ගැනීමටත් කටයුතු කළ යුතු වේ.
- අදාල වර්ෂයේ නොවැම්බර් මස 30 දිනට පෙර අවසන් කිරීමට හැකි වන සේ ව්‍යාපෘති ආරම්භ කිරීමට වග බලා ගත යුතු වේ.
- මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ග්‍රාමීය මට්ටමේදී ක්ෂේත්‍ර නිලධාරීන්ද, කලාප මට්ටමේ දී කලාප කළමනාකරුවන්, ප්‍රාදේශීය මට්ටමේ ප්‍රාදේශීය ලේකම්, මූලස්ථාන කළමනාකරු, කළමනාකාර අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරුවන් විසින් ද දිස්ත්‍රික් මට්ටමේදී දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ/ දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ විසින් ද නිරන්තර අධීක්ෂණයට ලක් කළ යුතුය.

## 09. මෙහෙයුම් හා ඇගයුම් ක්‍රියාවලිය:-

- දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ විසින් තම දිස්ත්‍රික්කයෙහි ආදර්ශ ගම්මානය තුළ ක්‍රියාත්මක කළ යුතු ජීවනෝපාය ව්‍යාපෘති යෝජනාවන් කෙරෙහි සමස්ත අධීක්ෂණය සිදු කළ යුතුය. ජීවනෝපාය සංවර්ධන / අලෙවි සංවර්ධන / සමාජ සංවර්ධන / ප්‍රජා මූල සංවිධාන / පුහුණු ආදී අංශවලට අදාළ මාසික ප්‍රගතිය වෙන වෙනම, එළඹෙන මස පස් වන දිනට ප්‍රථම මා වෙත එවිය යුතුය.
- ග්‍රාමීය මට්ටමේදී ඉහත කී කමිටුව ප්‍රජා සහභාගීත්වය සහිතව මසකට දෙවරක්වත් ප්‍රගතිය සමාලෝචනය කළ යුතුය.
- ප්‍රාදේශීය මට්ටමේදී ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුතුව අවම වශයෙන් මසකට වරක්වත් අදාළ සියළු පාර්ශවයන් කැදවා ප්‍රගති සමාලෝචනයක් කළ යුතු වේ. දිස්ත්‍රික්

මට්ටමෙන් පවත්වනු ලබන මාසික ප්‍රගති සමාලෝචන රැස්වීමේදී මේ සම්බන්ධයෙන් සාකච්ඡාවට ගැනීම වඩාත් සුදුසු වේ.

- සියළුම ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර තත්ත්වය පිළිබඳවත්, ක්‍රියාත්මක කරන අවස්ථාවේදීත් අදාළ ඡායාරූප / දත්ත / තොරතුරු රැස්කර තබා ගැනීම සිදු කළ යුතු වේ. මන්දයත් පැවති තත්ත්වයත් සිදු වු වෙනස්කමත් එහි දිගුකාලීන බලපෑමත් පිළිබඳව විශ්ලේෂණයන් සිදු කිරීමට එම තොරතුරු අත්‍යවශ්‍ය වන බැවිනි.

මෙම වැඩසටහනට අදාලව මගේ අංක **DDD/HO/04/07/E.F. Village** *හා* **2016.06.13** දිනැතිව එවන ලද ලිපියෙහි සඳහන් කරන ලද උපදෙස් හා මඟ පෙන්වීම් ඇතුලත් චක්‍ර ලේඛය මෙය බවද වැඩිදුරටත් දන්වමි. ඒ අනුව මෙම චක්‍රලේඛ උපදෙස්, මුදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන නීති රීති අනුගමනය කරමින් මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබ ඇතුළු නිලධාරින්ගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කරමි.

චන්ද්‍රා වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන ගරු අමාත්‍ය එස්.බී. දිසානායක මැතිතුමා -කා.දැ.ගැ.ස.
2. සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන ගරු නියෝජ්‍ය අමාත්‍ය රංජන් රාමනායක මැතිතුමා - කා.දැ.ගැ.ස.
3. සියළුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන්ලා -කා.දැ.ගැ.ස.
4. සියළුම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන්ලා -කා.දැ.ගැ.ස.
5. ලේකම්, සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය -කා.දැ.ගැ.ස.
6. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ.ස.
7. අතිරේක ලේකම් (දිවිනැගුම), සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය -කා.දැ.ගැ.ස.
8. ප්‍රධාන ගණකාධිකාරී, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ.ස.
9. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ.ස.
10. සියළුම අංශ ප්‍රධානීන් , දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව -අ.ක.ස.
11. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් -කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
12. සියළුම දිවිනැගුම මූලස්ථාන කළමණාකරුවන් - අ.ක.ස. හා දිවිනැගුම ප්‍රජා මූල බැංකු කළමණාකරුවන් සහ දිවිනැගුම සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා